ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දියාව සහ ශ්‍රී ලංකාව කරයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමට අත්සන් තබයි</u>**

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ එවකට ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ක්ෂෙනුකා ධීරණි සෙනෙවිරත්න මහත්මිය ඉන්දීය රජයේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 290ක ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ කරයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමට 2024 දෙසැම්බර් 16 වන දින අත්සන් තැබූහ.

2. මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සීමාසහිත සී නෝර් පදනම යටතේ පවතින කරයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය සිවිල් කටයුතු සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, අමුද්‍රව්‍ය සහ සේවා යනාදිය මිලදී ගැනීම ආවරණය කරනු ඇත. සම්පූර්ණයෙන්ම මෙහෙයුම් කටයුතු ඇරඹූ පසු ප්‍රතිසංස්කරණය කළ බෝට්ටු අංගනය දේශීය ධීවරයන් සඳහා ජීවනෝපාය අවස්ථාවන් ඉහළ නංවනු ඇති අතර බෝට්ටු අංගනය ආශ්‍රිතව ඉදිවන කුඩා පරිමාණ ව්‍යාපාර හේතුවෙන් විවිධ රැකියා අවස්ථාවන් ද නිර්මාණය කරනු ඇත.

3. ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාවේ සංවර්ධන සහයෝගීතා කළඹ ඇමරිකානු ඩොලර් බිලියන 5කට අධික අතර ඉන්දියාවේ ජනතා කේන්ද්‍රීය සංවර්ධන සහය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම සිටින ජනතාවගේ දෛනික ජීවිතයට සැලකිය යුතු ධනාත්මක වෙනසක් ඇති කරයි. නිවාස 41,000කට අධික සංඛ්‍යාවක් ඉදිකිරීම සහ නවීකරණය කිරීම, සංහිඳියා ව්‍යාපෘතියක් වශයෙන් යාපනයේ අති නවීන සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීම, කන්කසන්තුරය වරායේ අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම, යාපනයේ විවිධ පාසල් සහ රෝහල් ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම, තිරුකටේස්වරම් කෝවිල ප්‍රතිසංස්කරණය කිරීම, කෘෂිකාර්මික ප්‍රජාව සඳහා විශාල වශයෙන් සහයෝගය ලබාදීම සහ බෝට්ටු, දැල් ආම්පන්න, මෝටර්, අධි ශීතකරණ යනාදිය ලබාදෙමින් ධීවර ප්‍රජාවට සහයෝගය ලබා දීම උතුරු පළාත තුළ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘතීන් අතරින් කිහිපයකි.

***

කොළඹ

2025 ජනවාරි 02